# 3 මගේ රට



1. පාන්දර ම
එහෙන් මෙහෙන්
ඇසෙයි කුරුලු ගීතේ

ඕලු නෙළුම්
පිපී වැනෙයි
පිරිලා වැව් ගානේ

ඇළ දෙළ ගං
ඉවුරු දිගේ
වනමල් පෙති පාවේ

සුදුවැල්ලේ
කවඩි උඩින්
රැල පෙරළෙයි මූදේ

උසට උසේ
කඳු ද පෙනේ
වලාකුළු ද ගෑවේ

පිපෙන සමන්
පිච්ච පොකුරු
නැළවෙයි හඳපානේ

ඉර එළියට
හඳ එළියට
වෙලේ ගොයම් නෑවේ

වනන්තරේ
ගස් බිල්වල
මී පැණි බිඳු බේරේ

හරි සුවඳයි
පැහෙයි ඉදෙයි
පලතුරු හැම වාරේ

පුංචි අපට
සිරි සැප දෙයි
සිරි ලංකා දීපේ

2. මේ රට මගෙ රට මා ඉපදුණ රට
හැදෙන වැඩෙන රට මගේ ම මව් රට
සරුපස පොළොවෙන් වැහිබිඳු අහසෙන්
මිණිකැට මුතුකැට ඇත මගෙ සිරිලක

මගෙ සිරිලක ගැන ලොවට කියමි මම
සුරපුරයක් වෙන ලොවේ මෙවැනි නැත
එඩිතරකම ඇති කම්මැළිකම නැති
ළමයි සිටින රට මගෙ මේ සිරිලක

3. අහස පෙනෙන්නා නිලට නිලේ - නිල්වියනක් වාගෙයි
ඒ මැද සුදු හඳහාමි දිලේ - කිරිබිංදුව වාගෙයි

ගස්වල කොළ හඳ එළිය වැටී - රිදී වගේ පාටයි
ඒවා සුළඟට නටන හැටී - ලෝකෙ ම සුදුපාටයි

සඳරැස් කොළ අතරින් රිංගා - මේ මිදුලට ආවා
අත්පුඩි ගසමින් පොඩි නංගා - හඳහාමී කීවා

මිදුලේ ගස් අතු සෙවණැල්ලේ සඳරැස් බිඳු නටතී
තණපිටිවල හෝ සුදුවැල්ලේ පොඩිදරුවෝ නටතී

4. රන් කරලින් බර නිල්ල සිදීලා
රන් කරලින් නැගි ගීත ගයාලා
රන් කරලින් නැමි කෙතක් බලාලා
රන් කරලේ මහිමය හඬවාලා

රන් ඇට එකකුත් බිම නොදමන්නයි
රන් චාමර ලෙස මිටි ගොඩවෙන්නයි
රන් බැත උතුරා අටුව පිරෙන්නයි
රන් දිවයින අපෙ බතින් සදන්නයි

## ක්‍රියාකාරකම : 1

ගුරුතුමා/ගුරුතුමීගේ උදව් ඇතිව මෙම ගීත හා කවි තාලානුකූල ව ගායනා කරන්න.

## ක්‍රියාකාරකම : 2

අත්පුඩි ගසමින්, තාල තබමින් ගායනා කරන්න.

## ක්‍රියාකාරකම : 3

තනි තනි ව හා කණ්ඩායම් ගත වී ගායනා කරන්න.

## ක්‍රියාකාරකම : 4

ගුරුතුමා/ගුරුතුමී සමග එක් වී ගීත හා කවිවල සඳහන් කරුණු සාකච්ඡා කර සිත්ගන්නා තැන් ගැන කියන්න.

## ක්‍රියාකාරකම : 5

මෙබඳු ළමා ගීත හා කවි ඇතුළත් ශ්‍රව්‍යපටවලට සවන් දෙන්න. ඒවා අනුකරණය කරමින් ගායනා කරන්න.

## ක්‍රියාකාරකම : 6

ඔබ දන්නා මෙබඳු ළමා ගීත හා කවි පන්තියට ඉදිරිපත් කරන්න.